# පුරාවිද්‍යාව

## ශාස්ත්‍රවේදී කලා (බාහිර) උපාධිය

| **ස්තරය** | **සමාසිකය** | **පාඨමාලා කේතය** | **පාඨමාලා ඒකකයේ නම** | **අනිවාර්ය/ වෛකල්පිත** | **අධ්‍යයන සම්භාර** |
|---|---|---|---|---|---|
| ස්තරය 01 | I සහ II | ARCH 18214 | පුරාවිද්‍යාවේ ඉතිහාසය | අනිවාර්ය | 4 |
| | | ARCH 18224 | පුරාවිද්‍යාවේ නිර්වචන, ක්‍රම හා විධි | අනිවාර්ය | 4 |
| ස්තරය 02 | III සහ IV | ARCH 28214 | ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා මූල ඉතිහාසය | අනිවාර්ය | 4 |
| | | ARCH 28224 | අභිලේඛන හා නාණක විද්‍යාව: ශ්‍රී ලංකාව හා ඉන්දියාව | අනිවාර්ය | 4 |
| ස්තරය 03 | V සහ VI | ARCH 38214 | ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ පුරාණ කලාව හා වාස්තු විද්‍යාව | අනිවාර්ය | 4 |
| | | ARCH 38224 | ආසියාවේ ස්ථාන හා ස්මාරක | අනිවාර්ය | 4 |

| | |
|---|---|
| පාඨමාලා කේතය | ARCH 18214 |
| වර්ගය | හර |
| මාතෘකාව | පුරාවිද්‍යාවේ ඉතිහාසය |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයන්ට පුරාවිද්‍යාව ශික්ෂණයක් ලෙස වර්ධනය වූ ආකාරය විස්තර කිරීමට, 20 වන සියවසේ යුරෝ - ඇමරිකානු පුරාවිද්‍යාවේ ප්‍රධාන වර්ධනයන් විස්තර කිරීම සහ ඒ සඳහා දායක වූ වැදගත් පුරාවිද්‍යාඥයින් හඳුනා ගැනීමට, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාවේ ඉතිහාසය විස්තර කිරීමට, ඉන්දියානු පුරාවිද්‍යාවේ වැදගත් අවධීන් විස්තර කිරීමට, පැරණි ලෝක ශිෂ්ටාචාරයන් ගොඩනැගීම හා සංවර්ධනය වීම විස්තර කිරීමට සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිසංස්කරණ කටයුතුවල ඉතිහාසය විස්තර කිරීමට හැකියාව ලැබෙනු ඇත. |
| පාඨමාලා අන්තර්ගතය | පුරාවිද්‍යාවේ ඉතිහාසයඃ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව සහ ලෝකය, පුරාවිද්‍යාව හා උරුමය ආරක්ෂා කිරීම සඳහා වූ විවිධ ප්‍රවේශයන් සහ ලෝකයේ ප්‍රධාන ශිෂ්ටාචාරයන් ගොඩනැගීම හා සංවර්ධනය වීම විස්තර කිරීම. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Bahn, Paul and Colin Renfrew (1991) *Archaeology: Theories Methods and Practice*, Thames and Hudson Ltd, London.<br>• ගුණවර්ධන, ප්‍රිශාන්ත (2007) *පුරාවිද්‍යාව හැඳින්වීම හා මූලික සංකල්ප, සමන්ති ප්‍රකාශකයෝ, ජා ඇල*<br>• බස්නායක,එච්.ටී. සහ උදා හෙට්ටිගේ (1992) *පුරාවිද්‍යා ප්‍රවේශය*, ගොඩගේ, කොළඹ.<br>• සෝමදේව, රාජ් විද්‍යාලංකාර, ඒ., කන්නන්ගර, පී. (2016). ඉපැරණි ලෝක ශිෂ්ටාචාර, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| අතිරේක කියවීම් | |

| | |
|---|---|
| පාඨමාලා කේතය | ARCH 18224 |
| වර්ගය | හර |
| මාතෘකාව | පුරාවිද්‍යාවේ නිර්වචන, ක්‍රම හා විධි |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයන්ට පුරාවිද්‍යාවේ නිර්වචන, අරමුණු සහ විෂය පථය විස්තර කිරීමට, පුරාවිද්‍යා ගවේෂණයේ මූලික ශිල්ප ක්‍රම විස්තර කිරීමට, පුරාවිද්‍යා කැණීමේ මූලික ශිල්ප ක්‍රම විස්තර කිරීමට, සංරක්ෂණ ක්‍රම සහ ශිල්ප ක්‍රම විස්තර කිරීමට, පුරාවිද්‍යාත්මක කාලනිර්ණ ක්‍රම විස්තර කිරීමට, පුරාවිද්‍යාවේ භාවිතා වන රසායනාගාර සහ පරිගණක ශිල්පීය ක්‍රම සහ විධි විස්තර කිරීමට, පුරාවිද්‍යාවේ වැඩිපුරම භාවිතා කරන ලද විද්‍යාගාර සහ ක්ෂේත්‍ර අත්පොත්වල පරිච්ඡේද/ තේමාත්මක සංවිධානය විස්තර කිරීමට ප්‍රදර්ශන හා කෞතුකාගාර ක්‍රම විස්තර කිරීමට හැකියාව ලැබෙනු ඇත. |
| පාඨමාලා අන්තර්ගතය | පුරාවිද්‍යාවේ පුළුල් අර්ථයන්, පුරාවිද්‍යාවේ භාවිතා වන විවිධ ශිල්පීය ක්‍රම සහ ඒවායේ යාන්ත්‍රණයන්, පුරාවිද්‍යාත්මක නිදර්ශන සහ ඡායාරූපකරණය, ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රම, කැණීම් ක්‍රම, පුරාවිද්‍යාවේ දත්ත වර්ගීකරණ විධි සහ ශිල්ප ක්‍රම, කෞතුකාගාර සහ ඒවායේ එකතුන්, පුරාවිද්‍යාත්මක දැනුම බෙදා හැරීමේ ක්‍රම. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Adkins, Lesley and Roy Adkins, (1996), *An Introduction to Archaeology*, Quantum books, London.<br>• Bahn, Paul and Colin Renfrew, (1991), *Archaeology: Theories Methods and Practice*, Thames and Hudson Ltd, London.<br>• Braker, Philip, (1998), *Techniques of Archaeological Excavations*, Routledge, London.<br>• බස්නායක, එච්.ටී. සහ උදා හෙට්ටිගේ, (2008), *පුරාවිද්‍යා ප්‍රවේශය*, ගොඩගේ, කොළඹ.<br>• ගුණවර්ධන, ප්‍රිශාන්ත (2007), පුරාවිද්‍යාව හැඳින්වීම හා මූලික සංකල්ප, සමන්ති ප්‍රකාශකයෝ, ජා ඇල. |
| අතිරේක කියවීම් | |

| | |
|---|---|
| පාඨමාලා කේතය | ARCH 28214 |
| වර්ගය | හර |
| මාතෘකාව | ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ ප්‍රාග් හා මූල ඉතිහාසය |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයන්ට ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය පිළිබඳ 19 වන සියවසේ පුරාසක්තවේදීන්ගේ අධ්‍යයන විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියානු උප මහද්වීපයේ ප්‍රාග් හා මූල ඓතිහාසික කැණීම් විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියානු උප මහද්වීපයේ පූර්ව හා පශ්චාත් ස්වාධීන පර්යේෂකයින්ගේ හා ප්‍රාග් හා මූල ඓතිහාසික පර්යේෂණ විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ වර්තමාන ප්‍රාග් හා මූල ඓතිහාසික පර්යේෂණ විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ සහ උප මහද්වීපයේ සියලු ප්‍රධාන ප්‍රාග් හා මූල ඓතිහාසික පර්යේෂණ ප්‍රකාශන ලැයිස්තුගත කිරීමට, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියානු උප මහද්වීපයේ ප්‍රාග් ඓතිහාසික කාලානුක්‍රමය හා ප්‍රධාන ප්‍රවාහයන් විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියානු උප මහද්වීපයේ ප්‍රාග් ඓතිහාසික යුගයේ තාක්ෂණික, සංස්කෘතික කාල පරිච්ඡේද විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ පුරාපරිසරය සහ පුරාපරිසර වෙනස්වීම් සහ පුරාපාරිසරික කලාප විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික තාක්ෂණයන් සහ යැපුම් උපාය මාර්ග විස්තර කිරීමට හා ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික විශ්වාස, චාරිත්‍ර හා කලාව විස්තර කිරීමට හැකියාව ලැබෙනු ඇත |
| පාඨමාලා අන්තර්ගතය | ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රාග් හා මූල ඓතිහාසික පර්යේෂණ පර්යේෂණ ඉතිහාසය, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රාග් හා මූල ඓතිහාසික කාල පරිච්ඡේදය, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ප්‍රාග් හා මූල ඓතිහාසික පරිසරය සහ යැපුම් රටාවන්. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Deraniyagala, P. E. P. 1958a. *The Pleistocene of Ceylon*. Ceylon National Museums Publication.<br>• Perera, N. (2010). *Prehistoric Sri Lanka: Late Pleistocene rock shelters & an open-air site*. British Archaeological Report No. 2142. Oxford: Archaeopress.<br>• Deraniyagala, S. U. (1992). *The Prehistory of Sri Lanka, Part I & I I – an ecological perspective*, Department of Archaeology Survey, Memoir Volume 8, Colombo: Department of Archaeology Survey<br>• Roberts, A. (2018). Evolution: The Human Story, 2nd Edition.<br>• කටුගම්පොළ, මංගල.,(2020), පුරාණ ශ්‍රී ලංකාවේ සුසාන චාරිත්‍ර, දෙවලපොළ මැටි කුටීර සුසාන කැණීම, කඩුල්ල ප්‍රකාශන. |
| අතිරේක කියවීම් | |

| | |
|---|---|
| පාඨමාලා කේතය | ARCH 28224 |
| වර්ගය | හර |
| මාතෘකාව | අභිලේඛන හා නාණක විද්‍යාවඃ ශ්‍රී ලංකාව හා ඉන්දියාව |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයන්ට ලෝක පරිමාණයෙන් ලේඛන ක්‍රමයන්ට අනුවර්තනය වීම විස්තර කිරීමට, බ්‍රාහ්මී ලේඛනයේ මූලාරම්භය හා සම්බන්ධ ගැටළු විස්තර කිරීමට, වැදගත් ඉන්දියානු ශිලාලිපි විස්තර කිරීමට, සිංහල හෝඩියේ රූප විද්‍යාත්මක ඉතිහාසය විස්තරාත්මකව විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ තෝරාගත් ශිලා ලිපි සංඛ්‍යාවක් විස්තර කර ශ්‍රී ලංකාවේ පුරා අක්ෂර විද්‍යාත්මක හා අභිලේඛන විද්‍යාත්මක අධ්‍යයනය සඳහා ඒවායේ වැදගත්කම පැහැදිලි කිරීමට, ලෝකයේ මුදල් පද්ධතිවල ආරම්භය විස්තර කිරීමට හා ශ්‍රී ලංකාවේ නාණකවිද්‍යාවේ ඉතිහාසය සහ ලක්ෂණ විස්තර කිරීමට හැකියාව ලැබෙනු ඇත. |
| පාඨමාලා අන්තර්ගතය | ලෝකයේ ලේඛනයේ හා මුදල් පද්ධතිවල ඉතිහාසය, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ අභිලේඛන හා නාණක විද්‍යාත්මක පර්යේෂණවල ඉතිහාසය, අභිලේඛන හා නාණක විද්‍යාත්මක දත්ත වර්ගීකරණය, කියවීම, ලිවීම පිළිබඳ ප්‍රායෝගික ඉගැන්වීම්. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Buhlar, Georg (2004) *Indian Paleography*, Munshiram.<br>• Dias, Malini (ed.) (1991) *Epigraphical Notes*, Department of Archaeology, Colombo.<br>• Paranavitana, S. (1970) *Inscriptions of Ceylon vol.I*, Archaeological survey department, Colombo.<br>• Wickremasinghe, D.M.D.Z (1912) *Epigraphia Zeylanica vol. I*, Oxford University press, London.<br>• විජේසේකර, නන්දදේව (සංස්.) (1990) *අභිලේඛන*, පුරාවිද්‍යා<br>• දෙපාර්තමේන්තුව, කොළඹ. |
| අතිරේක කියවීම් | |

| | |
|---|---|
| පාඨමාලා කේතය | ARCH 38214 |
| වර්ගය | හර |
| මාතෘකාව | ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ පුරාණ කලාව හා වාස්තු විද්‍යාව |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයන්ට ශ්‍රී ලංකාවේ පුරාණ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය විස්තර කිරීමට, ඉන්දියාවේ පුරාණ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය විස්තර කිරීමට හැකියාව ලැබෙනු ඇත. |
| පාඨමාලා අන්තර්ගතය | පුරාණ ශ්‍රී ලංකාවේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ හැඳින්වීම, කලා හා ගෘහ නිර්මාණ ශිල්පීය සම්ප්‍රදායන්, පුරාණ ශ්‍රී ලංකාවේ ගෘහනිර්මාණ ශිල්පයේ කලාත්මක වටිනාකම පිළිබඳ කෙටි හැඳින්වීමක්, ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ කලාව සහ ගෘහ නිර්මාණ ශිල්පය සහ වෛදික යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය, මෞර්ය හා සුංග යුගවල සිතුවම් හා ගෘහ නිර්මාණ ශිල්පය. ඉන්දියාවේ පර්වත හාරා තැනූ ගුහා, දකුණු ඉන්දියාවේ බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය, කුෂාණ ගෘහනිර්මාණ ශිල්පය, ගුප්ත සහ පාල කාල පරිච්ඡේද, පුරාණ ඉන්දියාවේ හින්දු ගෘහනිර්මාණ ශිල්පය, ජෛන ගෘහනිර්මාණ ශිල්පය සහ ඉන්දියාවේ මුස්ලිම් ගෘහ නිර්මාණ ශිල්පය |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Bahn, Paul and Colin Renfrew (1991) *Archaeology: Theories Methods and Practice*, Thames and Hudson Ltd, London.<br>• ගුණවර්ධන, ප්‍රිශාන්ත (2007) *පුරාවිද්‍යාව හැඳින්වීම හා මූලික සංකල්ප, සමන්ති ප්‍රකාශකයෝ, ජා ඇල*<br>• බස්නායක,එච්.ටී. සහ උදා හෙට්ටිගේ (1992) *පුරාවිද්‍යා ප්‍රවේශය,* ගොඩගේ, කොළඹ.<br>• සෝමදේව, රාජ් විද්‍යාලංකාර, ඒ., කන්නන්ගර, පී. (2016). ඉපැරණි ලෝක ශිෂ්ටාචාර, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| අතිරේක කියවීම් | |

| | |
|---|---|
| පාඨමාලා කේතය | ARCH 38224 |
| වර්ගය | හර |
| මාතෘකාව | ආසියාවේ ස්ථාන හා ස්මාරක |
| ඉගෙනුම් ඵල | මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයන්ට ශ්‍රී ලංකාවේ ජාතික වශයෙන් වැදගත් ස්ථාන සහ ස්මාරක විස්තර කිරීමට, ශ්‍රී ලංකාවේ ස්මාරක ප්‍රතිසංස්කරණය කිරීමේ ඉතිහාසය විස්තර කිරීමට, ඉන්දියානු උප |

| | |
|---|---|
| | මහද්වීපයේ වැදගත් ස්ථාන විස්තර කිරීමට, ආසියාවේ ප්‍රධාන ස්ථාන සහ ස්මාරක විස්තර කිරීමට හැකියාව ලැබෙනු ඇත. |
| පාඨමාලා අන්තර්ගතය | ලෝක උරුම සංකල්පයේ ඉතිහාසය, ජාත්‍යන්තර ප්‍රඥප්ති, උරුමයන් ආරක්ෂා කිරීම සඳහා වූ දේශීය නීතිත ශ්‍රී ලංකාව සහ ඉන්දියාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ආසියාවේ ලෝක උරුම ස්ථාන විස්තර කිරීම. |
| ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය | දේශන, මාර්ගගත දේශන, එල්.එම්.එස්. (LMS), සාකච්ඡා, ඉදිරිපත් කිරීම්, නිබන්ධන සහ පැවරුම් යනාදී විෂය ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රයෝජනයට ගනියි. |
| ඇගයීමේ ක්‍රමය | අධ්‍යයන වර්ෂය අවසානයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 100% හෝ අධ්‍යයන වර්ෂය අවසානයේ දී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 80% ක් සහ පැවැරුම් සඳහා ලකුණු 20% ක් හිමිවේ. |
| නිර්දේශිත කියවීම් | • Buhlar, Georg (2004) *Indian Paleography*, Munshiram.<br>• Dias, Malini (ed.) (1991) *Epigraphical Notes*, Department of Archaeology, Colombo.<br>• Paranavitana, S. (1970) *Inscriptions of Ceylon vol.I*, Archaeological survey department, Colombo.<br>• Wickremasinghe, D.M.D.Z (1912) *Epigraphia Zeylanica vol. I*, Oxford University press, London.<br>• විජේසේකර, නන්දදේව (සංස්.) (1990) *අභිලේඛන*, පුරාවිද්‍යා<br>• දෙපාර්තමේන්තුව, කොළඹ. |
| අතිරේක කියවීම් | |